# වාර්ෂික වාර්තාව
# 2018

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## දැක්ම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට හා ගෝලීය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම පිණිස කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් අංශයන්හි පශ්චාත් උපාධි හා පර්යේෂණ කටයුතු කිරීමෙහිලා විශිෂ්ඨත්වයකින් හෙබි කලාපීය මධ්‍යස්ථානයක් බවට පත් වීම.

## මෙහෙවර

පශ්චාත් අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස සිය සේවාව ලබා දෙමින් උසස් ගුණාත්මක බවින් යුත් ඉගැන්වීම් හා පර්යේෂණ තුළින් අධ්‍යාපනික වශයෙන් උසස් ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ පුහුණුවක් ලබා දීම හා කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන්ට ධනාත්මක දායකත්වයක් සපයන්නා වූ ප්‍රවීනතාවයෙන් හෙබි සේවයට කැප වූ වෘත්තිකයින් පිරිසක් බිහි කිරීම.

## ඉලක්ක

* සියලු පශ්චාත් උපාධිවල අදාළත්වය සහ ගුණාත්මකබව පවත්වාගෙන යාම.

* විශිෂ්ට පර්යේෂණ සංස්කෘතියක් කරා යොමුවූ උසස් මට්ටමේ පර්යේෂණ, නවනිර්මාණ සහ ධාරිතා වර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

* ප්‍රවීණ කාර්යමණ්ඩලයක් සහ කැපවී ක්‍රියාකරන අධ්‍යයන, පරිපාලන සහ අධ්‍යයන සහාය කාර්යමණ්ඩලයකින් යුක්තවීම.

* ශිෂ්‍යයින් සහ ආයතනයේ කාර්යමණ්ඩලය තුළ විශිෂ්ට වෘත්තීය කුසලතා ආචාරධර්ම යහපැවතුම් සහ නායකත්ව ගුණාංග වර්ධනය කිරීම.

* දැනුම තොරතුරු සියලු පාර්ශවකරුවන් අතර ව්‍යාප්ත කිරීම

* යහපාලනය ප්‍රවර්ධනය කිරීම.

* කාර්යක්ෂම පරිපාලනයක් සහ තිරසාර මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙනයෑම.

# අධ්‍යක්ෂකගේ ප්‍රකාශය/ සමාලෝචනය



කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙරට පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනයක් වශයෙන් 1979 අංක 9 දරණ ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරනලද අතර වර්තමානයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ආයතනයක් වශයෙන් එහි කළමණාකරණ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමේ ප්‍රධානත ම අරමුණු වූයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙරට තුළ පවතින ශක්‍යතාවය තව දුරටත් වැඩි දියුණු කිරීම සහ මෙරට තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්තවෙමින් පවතින කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පුහුණු විද්‍යාත්මක දැනුමෙන් හෙබි පිරිසක් බිහිකිරීමත්ය. අංග සම්පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් සහ මෙරටේ සහ කලාපයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා පවත්නා විශිෂ්ට මධ්‍යස්ථානයක් වශයෙන් වැඩිදියුණු වෙමින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම ජාතික අවශ්‍යතාවය දශක හතරක කාලයක් පුරා ඉටුකර ඇත.

මෙම වර්ෂ 40 ක කාල පරිච්ඡේදය තුළ ආරම්භයේදී ශිෂ්‍යයන් 19 දෙනෙකු සහ වර්තමානය වන විට ශිෂ්‍යයින් 500 කට අධික ප්‍රමාණයක් ඇතුළත් කරගනිමින් මෙම ආයතනය ශිෂ්‍යයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඉතා සැළකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉතා පුළුල් විෂය පරාසයක් තුළ පශ්චාත් උපාධිධාරීන් 5000 කට අධික ප්‍රමාණයක් මේ දක්වා මෙම ආයතනය විසින් බිහිකරනු ලැබ ඇත. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව කෘෂිකර්ම, ඉංජිනේරු, පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා, මානව ශාස්ත්‍රවිද්‍යා, වෛද්‍ය සහ ව්‍යාපාර කළමණාකාර යනාදී වශයෙන් පවතින විවිධවූ විෂයධාරා සියල්ලමපාහේ නියෝජනය වන උපාධිධාරීන්ගෙන් සමන්විත වෙයි. බංගලාදේශය, ඉන්දියාව, නේපාලය, මියන්මාරය, නයිජීරියාව, ඕමානය සහ ඝානාව යන රටවලින් පැමිණි විදේශීය උපාධිධාරීන් මේ වනවිට සිය පශ්චාත් උපාධිය කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේදී සම්පූර්ණ කරනු ලැබ ඇති අතර තායිලන්තය, වියට්නාමය, ඝානාව, මාලදිවයින සහ ඇෆ්ගනිස්තානය යන රටවලින් පැමිණි ශිෂ්‍යයෝ මේ වන විට තම පර්යේෂණ උපාධි පාඨමාලා හදාරමින් සිටිති.

මේ වන විට අධ්‍යයන මණ්ඩල 11 ක් යටතේ විද්‍යාපති උපාධි 31 ක් ආයතනය විසින් පිරිණමනු ලැබේ. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් එහි සියලුම පාඨමාලාවල පාහේ ඉගැන්වීම් ඉතා සුවිශේෂී අනන්‍ය වූ ආකාරයකට සිදුකරනු ලබන අතර විශ්වවිද්‍යාල , රාජ්‍ය සහ රාජ්‍යනොවන සංවිධාන, ජාතික සහ ජාත්‍යන්තර ආයතන, පෞද්ගලික අංශයේ ආයතන යනාදියෙන් පැමිණෙන පුළුල් පුහුණු සහ පර්යේෂණ අත්දැකීම්වලින් හෙබි බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් විසින් පාඨමාලා පවත්වනු ලැබේ. අති නවීන තාක්ෂණික උපකරණ භාවිතයෙන් බොහෝවිට කෘෂිකර්ම පීඨය හරහා අංග සම්පූර්ණ පර්යේෂණාගාර තුළ අවශ්‍ය ප්‍රායෝගික දැනුම සහ පුහුණුව ලබාදේ. ශාස්ත්‍රීය දැනුම ලබාදීමට පමණක් සීමා නොවෙමින් බොහෝ පර්යේෂණ ශිෂ්‍යයින් ප්‍රමාණයක් සිය පාඨමාලාවලට ආකර්ෂණය කර ගැනීම කෙරෙහි කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය මේවන විට අවධානය යොමුකර ඇත.

උපාධි අධ්‍යයනයේදී උසස් අධ්‍යාපනයේ අභිවෘද්ධිය උදෙසා පුරෝගාමීව සිය මෙහෙවර ඉටුකරන අතරතුර කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය නිම් වලලු සමාජයේ පුලුල් පරාසයක් තුළ ව්‍යාප්ත කරමින් කොළඹ ප්‍රධාන නගරයේදී තම පාඨමාලා කටයුතු පැවැත්වීමට පියවර ගනු ලැබීය.

කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියේ ආයතන සහ සාක් රටවල කෘෂිකර්ම ක්ෂේත්‍රයේ හවුල්කාර පාර්ශව සමග ඉතා සමීප සහයෝගීතා පවත්වාගෙන යයි. පීඨ සාමාජිකයින්, පර්යේෂකයින්, කාර්ය මණ්ඩලය, සහ ශිෂ්‍යයින් ආයතන අතර හුවමාරු කරගැනීම සහ ඒකාබද්ධ පර්යේෂණ සම්මන්ත්‍රණ, සමුලු, සහ වැඩමුලු පැවැත්වීම තව දුරටත් අපගේ ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදෙන කාර්යයන් වේ. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අපගේ තරුණ විද්‍යාඥයින් ගෝලිය සංවර්ධන ක්‍රියාවලියේ අතිවිශිෂ්ට පුරවැසියන් සහ මානව ප්‍රාග්ධනය වශයෙන් සිය කුසලතා පෙන්වීම උදෙසා ධාරිතා සංවර්ධනය කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් අද්විතීය පුරෝගාමියෙකු ලෙස කටයුතු කිරීමට හැකිවීම අපහට ආඩම්බරයට කරුණකි.

# පටුන

පිටුව


<table>
<tr><td>අ</td><td>හැඳින්වීම</td><td>1</td></tr>
<tr><td>ආ</td><td>ජයග්‍රහණ</td><td>4</td></tr>
<tr><td>ඇ</td><td>අසමාර්තතා</td><td>5</td></tr>
<tr><td>ඈ</td><td>අනාගත සැලසුම්</td><td>5</td></tr>
<tr><td>ඉ</td><td>ජාත්‍යන්තරීකරණය</td><td>20</td></tr>
<tr><td>උ</td><td>කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 වර්ෂය ඉලක්ක කරගත් තිරසාරභාවය සම්බන්ධ වැඩසටහන්</td><td>22</td></tr>
<tr><td colspan="2">කෘෂි විද්‍යාපීඨ පුස්තකාලයේ වාර්තාව</td><td>23</td></tr>
<tr><td colspan="2">මූල්‍ය කාර්යය සාධනය</td><td>27</td></tr>
<tr><td colspan="2">ව්‍යවස්ථාපිත වාර්තාව සහ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති පිළිබඳ අනාවරණය කිරීම්</td><td>31</td></tr>
<tr><td colspan="2">පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</td><td>61</td></tr>
</table>

# ආයතනික ව්‍යූහය

# ආයතනයේ කළමනාකරණ මණ්ඩලය -2018

**නිලබලයෙන් පත්වන ලද සාමාජිකයින්**

1. මහාචාර්ය සී.එම්.බී දෙමටවැව, අධ්‍යක්ෂ, කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. ඩබ්.කේ.එල්.ඊ.වලල්ලාවිට මයා, ප්‍රධාන ගණකාධිකාරි, උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා
3. ජේ. ආර්.සී. ජයතිලක මයා, අධ්‍යක්ෂ, වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය.
4 බී. විජයරත්න මයා, ලේකම්, වාරිමාර්ග සහ කෘෂිකර්ම අමාත්‍යංශය නියෝජනය කිරීම සඳහා
5. ආචාර්ය ආර්.පී.එම්.පතිරත්න මයා, අතිරේක ලේකම්, (පශු සම්පත් සංවර්ධන) ග්‍රාමීය කටයුතු අමාත්‍යංශයේ ලේකම් නියෝජනය සඳහා
6. කේ.ඒ.අයි.ඩී. සිල්වා මයා, අධ්‍යක්ෂ, (ප්‍රතිපත්ති හා සැලසුම්)- පරිසර අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා
7. අනුර සතුරුසිංහ මයා , වන සංරක්ෂක ජෙනරාල් , වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම සඳහා
8 ආචාර්ය ජේ.ඩී.එච්.විජේවර්ධන, ලේකම්/අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
9. ආචාර්ය ඩබ්.එම්.ඩබ්.ඩබ් වීරකෝන්, අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
10. ආචාර්ය. එන්. වෙදසිංහ, අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
11. ආචාර්ය. ඒ. පී. හීන්නේද, අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
12. ආචාර්ය. ඩී. එම්. එස්. මුණසිංහ, පීඨාධිපති, පශු වෛද්‍ය සහ සත්වවිද්‍යා , පේරාදෙණිය විශ්වවිද්‍යාලය 13. මහාචාර්ය ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර, පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
14. මහාචාර්ය කේ.එල්.වසන්ත කුමාර, පීඨාධිපති, කෘෂිකර්ම පීඨය රුහුණු විශ්වවිද්‍යාලය
15. ආචාර්ය. එම්. පී.එස්. මාගමගේ, පීඨාධිපති, කෘෂිකර්ම පීඨය සබරගමුව විශ්වවිද්‍යාලය
16. ආචාර්ය ඩී සී අබේසිංහ, පීඨාධිපති ,කෘෂිකර්ම පීඨය, වයඹ විශ්ව විද්‍යාලය
17. ආචාර්ය ඒ.එම්.ජේ.බී.අධිකාරි, පීඨාධිපති කෘෂිකර්ම පීඨය, රජරට විශ්වවිද්‍යාලය
18. ආචාර්ය පී සිවරාජා, පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය
19. ආචාර්ය. කේ. සූරියකුමා, පීඨාධිපති, කෘෂිකර්ම පීඨය යාපනය විශ්වවිද්‍යාලය

**කෘෂිකර්ම පීඨයේ තෝරාපත්කරන ලද සාමාජිකයෝ**

20. ආචාර්ය එච් එම් වී ජී හේරත් ,කෘෂි ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
21. මහාචාර්ය එච් එල් ජේ වීරහේවා, කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
22. මහාචාර්ය ඊ ආර් එන් ගුණවර්ධන, කෘෂි ඉංජිනේරුවිද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
23. ආචාර්ය. එල්.එන්. ඒ. සී. ජයවර්ධන, කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
24. මහාචාර්ය පී.එල්.එල්.පී.සිල්වා මෙය, සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
25. මහාචාර්ය ටී. සිවානන්තවල්, ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
26. මහාචාර්ය එස් එස් කොඩිතුවක්කු, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
27. මහාචාර්ය ඩබ් ඒ.ජේ එම් ද කොස්තා, බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
28. මහාචාර්ය ඩී පී එන් පී විජේසිංහ, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
29. ආචාර්ය කේ.එස්.හේමචන්ද්‍ර, පැලෑටි ආරක්ෂණය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
30. ආචාර්ය ඩබ්.ඒ යූ. විතාරණ, පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද නියෝජිතයන්**

31. මහාචාර්ය එච් .පී.එම්. ගුණසේන, බෝග විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
32 මහාචාර්ය සමන් අබේසිංහ , උද්භිද විද්‍යා අධ්‍යයන අංශය රුහුණු විශ්ව විද්‍යාලය
33. මහාචාර්ය එස් කේ පින්නවල- සමාජවිද්‍යා අධ්‍යයන අංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
34 ආචාර්ය අයි.එස්.බී. අබේසිංහ- අධ්‍යක්ෂ, තේ පර්යේෂණ ආයතනය
35. ආචාර්ය. තිලක් අබයසේකර, වකුගඩුරෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය, අංශ ප්‍රධානී, වකුගඩු සහ වකුගඩු බද්ධ කිරීමේ අංශය, ශික්ෂණ රෝහල , මහනුවර.

# වගු

පිටුව


| | | |
|---|---|---|
| ආ.1 | සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු | 6 |
| ආ.2 | පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ලද දේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු | 7 |
| ආ.3 | උපාධි පාඨමාලාවල නියැලි විදේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු | 8 |
| ඇ.1 | අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු | 8 |
| ඇ.2 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු | 8 |
| ඈ.1 (අ) | 2018 වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් එළිදක්වනලද පර්යේෂණ ප්‍රකාශන | 9 |
| ඈ.1 (ආ) | වසරේදී අනුක්‍රමණිකගත වාර සඟරාවල ප්‍රකාශයට පත්කරන ලද සම්පූර්ණ පත්‍රිකා | 10 |
| ඈ.2 | විද්‍යා හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳ තොරතුරු | 14 |
| ඈ.4 | 2018 වර්ෂයේ පොදු ජනතාවට දැනුම සන්නිවේදනය කිරීම පිළිබඳ තොරතුරු | 14 |
| ඈ.5 | 2018 වර්ෂයේ දී ලද ජාතික සහ අන්තර්ජාතික සම්මාන | 17 |
| ඈ.6 | ආයතනය ලද ශිෂ්‍යත්ව, අධි ශිෂ්‍යත්ව සහ පුහුණු වැඩසටහන් (දේශීය සහ විදේශීය) | 20 |
| ඉ.1 | පවත්වන ලද අන්තර්ජාතික සම්මන්ත්‍රණ සහ වැඩමුළු | 20 |
| ඉ.2 | 2018 වර්ෂයේ දී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර | 21 |
| ඉ 3 | 2018 වර්ෂයේ දී උපාධි අපේක්ෂක පාඨමාලා ඉගැන්වීම් කටයුතු, පශ්චාත් උපාධි පාඨමාලා ඉගැන්වීම් කටයුතු, පරිසංවාද, වැඩමුලු සඳහා සහභාගීවූ ජාත්‍යන්තර කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු. | 22 |
| ඊ | 2018 වර්ෂය තුළ ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ තොරතුරු | 22 |

# වාර්ෂික වාර්තාව – 2018

## කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## (2018 දෙසැ.31 දිනට)

### අ. හැඳින්වීම

1972 අංක 1 දරණ පැරණි ලංකා විශ්වවිද්‍යාල පණත යටතේ 1974 අංක 2 දරණ ව්‍යවස්ථාව මගින් 1975 ජුනි මස දී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කර ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුයුක්ත කරන ලදී. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත ව්‍යවස්ථාව ආඥාපනතක් ලෙස සලකා ඒ අනුව කොමිසම විසින් 1980 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන ලෙස 1979 අංක 09 දරණ ව්‍යවස්ථාව පැනවන ලද අතර එමගින් ආයතනයේ නෛතික පදනම ස්ථාපිත විය. මෙම අද්විතීය ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා රට තුළ ශක්‍යතාව වර්ධනය කිරීමත් එහි සීග්‍රයෙන් ප්‍රසාරණය වන කෘෂිකර්ම අංශයට යෝග්‍ය වන පුහුණු විද්‍යාඥයන් සැපයීමත්ය. මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුයුක්ත කොට ඇත.

### අධ්‍යයන වැඩසටහන්

සිය අරමුණු කරා ළඟා වනු පිණිස කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වර්තමානයට වැදගත් වන්නා වූ විවිධ ඉහළ උපාධි වැඩසටහන් සැලසුම් කර ඇත. එමෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පවතින නානාවිද ඉල්ලුමට සරිලන සේ විෂයමාලාද බොහෝ අවස්ථාවල දී සංශෝධනයට ලක් කර ඇත. වර්තමානය වන විට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පාඨමාලා කටයුතු සහ පර්යේෂණ ද ඇතුළත් වන පරිදි දර්ශනශූරී, ව්‍යාපාර පරිපාලනශූරී, දර්ශනපති උපාධි වැඩසටහන් සහ විද්‍යාපති උපාධි වැඩසටහන් 31ක් පිරිනැමීමට සමත්ව ඇත. පශ්චාත් උපාධි සිසුන් හට විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතුවලට මෙන්ම පර්යේශන කටයුතුවලට ද රිසිසේ යොමුවිය හැකි වන ලෙස පූර්ණ කාලීන නේවාසික පුහුණු පාඨමාලා කෙරෙහි ආයතනයේ වැඩි අවධානය යොමු වී ඇත. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දෙන වැදගත් අභියෝගයක් වනුයේ සිය අධ්‍යයන කටයුතු මෙන්ම පර්යේෂණ කටයුතු කෙරෙහි ප්‍රමාණවත් කාලයක් මිඩංගු කළ හැකි සහ තම තමන්ට අදාළ විෂය ක්‍ෂේස්ත්‍රවලට පුළුල් ලෙස නිරාවරණය විය හැකි විනය ගරුක හා කැප විය හැකි ධෛර්ය සම්පන්න පිරිසක් නිර්මාණය කිරීමයි. මෙම ආයතනයෙන් බිහිවන උපාධිධාරීන්ගෙන් බලාපොරොත්තු වන්නේ ඔවුන්ගේ එවන් කැපවීම් තුළින් තම ජීවිතවල අවියෝජනීය කොටසක් බවට පත්විය යුතු ශක්තිමත් වෘත්තීය ආචාර ධර්ම වර්ධනය කිරීමයි.

ශ්‍රී ලංකා අධ්‍යාපන සුදුසුකම් කාර්යරාමුවේ (SLQF) නිර්දේශවලට සමාන වනසේ වර්ෂ 2017 සිට බලපැවැත්වෙන පරිදි ආයතනයෙහි දැනට පවතින රෙගුලාසි සංශෝධනය කරන ලද අතර ඒ අනුව ශිෂ්‍යයින් බඳවාගැනීම සිදුකරන ලදී. මෙම ආයතයෙන් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් වනුයේ;

විද්‍යාපති/ව්‍යාපාර කළමනාකරණපති ඃ සම්මාන 5ක නිර්දේශිතයක් ඇතුළත් පාඨමාලා කටයුතු.

විද්‍යාපති/ව්‍යාපාර කළමනාකරණපති ඃ වර්ෂයක කාල සීමාවක පර්යේෂණ ඇතුලත් පාඨමාලා කටයුතු .

දර්ශනපති/දර්ශනශූරී/ ව්‍යාපාර පරිපාලනශූරී - පර්යේෂණ පමණි

ඉහත දැක්වෙන විද්‍යාපති උපාධි වැඩසටහන්වල නියැලෙන ඉල්ලුම් කරුවන් ඒ ඒ පාඨමාලාවලට අවශ්‍ය කරනු ලබන සම්මාන සුදුසුකම් සපුරා ඇත්නම් ඔවුනට පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත් සුදුසුකම් මට්ටමෙන් ඉවත් වී යා හැකිය. ඒ අනුව සම්මාන 25ක් සම්පූර්ණ කරන අයට පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද, සම්මාන 20ක් සම්පූර්ණ කරන අයට පශ්චාත් උපාධි සහතික පත්‍ර සුදුසුකමද ලබා ගත හැකිය. ඉතා කෙටි කාල සීමාවක දී පශ්චාත් උපාධි සුදුසුකම් අවශ්‍ය වන අයැදුම් කරුවන් හට එම අරමුණ සපුරා ගත හැකි වන සේ මෙම පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමේ වැඩසටහන හඳුන්වා දෙනු ලැබුවේ ප්‍රථම වතාවටයි.

## ආචාර්ය මණ්ඩලය

ආචාර්ය මණ්ඩලය පර්යේෂණ හා ඉගැන්වීමේ පුළුල් අත්දැකීම්වලින් හෙබි විශිෂ්ට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 300කට අධික ප්‍රමාණයකින් සමන්විත වේ. මෙම ආචාර්ය මණ්ඩලයෙන් බහුතර පිරිසක් පේරාදෙණි විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයට අනුයුක්ත වන අතර සෙසු අය විශ්වවිද්‍යාල පද්ධතියේ අනිකුත් විශ්වවිද්‍යාල, රාජ්‍ය දෙපර්තමේන්තු, පර්යේෂණ ආයතන, සංස්ථා, පුද්ගලික අංශයේ ආයතන, ජාත්‍යන්තර ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරති.

2018 වසරේ දී අධ්‍යයන මණඩල 11ක් යටතේ සිසුන් 421 ක් විවිධ උපාධි සඳහා ලියාපදිංචිව සිටි අතර ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

විද්‍යාපති - 356 ව්‍යාපාර කළමනාකරණපති - 41 දර්ශනපති–09
දර්ශන ශූරී – 15 අනියම් - 0

තම පශ්චාත් උපාධි වැඩසටහන් සාර්ථකව නිම කළ ශිෂ්‍යයන් හට 2017 උපාධි ප්‍රදානෝත්සවයේ දී පහත සඳහන් පරිදි උපාධි පිරිණමන ලදී.

| | | | |
|---|---|---|---|
| දර්ශනශූරී | - 09 | දර්ශනපති | - 20 |
| විද්‍යාපති | - 320 | ව්‍යාපාර කළමනාකරණපති | - 22 |

## කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ශිෂ්‍ය සංගමය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ශිෂ්‍ය සංගමය විසින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන දිනයක් 2018/06/23 වැනි දින පවත්වන ලදී. දවස පුරා පැවැති මෙම වැඩසටහනෙහි පෙරවරු කාලයෙහි සැසිය විශ්වවිද්‍යාල ක්‍රීඩා භූමියෙහි පැවැති අතර නියෝජ්‍ය උපකුලපති විසින් ජාතික ධජය ද ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් විශ්වවිද්‍යාල ධජය ද ඔසවමින් එම උත්සවයේ සමාරම්භය සනිටුහන් කරන ලදී. සිසුන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් පැවැති මෙම වැඩසටහනට විනෝදාත්මක අංග රාශියක් ඇතුළත් වූ අතර එහි සන්ධ්‍යා සැසිය අති උත්කර්ශවත් ලෙස මහනුවර දී පවත්වන ලදි.

## වාර්ෂික සමුලුව

කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ 30 වැනි වාර්ෂික සමුලුව 2018 නොවැම්බර් 15 සහ 16 යන දෙදින තුළ මහනුවර දී පවත්වන ලදි. පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩබ්.ඒ යූ. විතාරණ මෙම සමුලුවේ සම්න්ධීකාරක ලෙස කටයුතු කළේය.

සමුලුවේ ආරම්භක සැසිය විශ්වවිද්‍යාලයේ උප කුලපති, කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති , සහ ජපානයේ අයිචි විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සන්නිවේදන පීඨයේ ගෝලීය නිදහස් කලා අධ්‍යයන අංශයේ මහාචාර්ය/ ඔස්ට්‍රියා ජාත්‍යන්තර පාංශු විද්‍යා සංගමයේ සභාපති මහාචාර්ය ටී කොසාකි යන ගෞරවනීය ආරාධිත අමුත්තන්ගේ සහභාගීත්වයෙන් පැවති අතර එහිදී මහාචාර්ය ටී කොසාකි මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදි. පවත්නා සහ අපේක්ෂිත අධ්‍යයන සහයෝගීතා සහ අනෙකුත් අදාළ කටයුතු සම්බන්ධයෙන් ආරම්භක සැසියේ ප්‍රදාන ආරාධිත අමුත්තා හැමවිට ම ඉමහත් වැදගත් සහ ගෞරවනීය පුද්ගලයෙකු වශයෙන් සළකනු ලබන අතර ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය අයි කුමාරස්වාමි මහතා ගෞරවනීය ප්‍රධාන අමුත්තා වශයෙන් එම අවස්ථාවට සහභාගී විය.

ඉන්දියාව, ජපානය, කැනඩාව, පිළිපීනය සහ ඔස්ට්‍රෙලියාව ඇතුළු ජාත්‍යන්තර ආයතනවල මෙන් ම දේශීය ආයතනවල පර්යේෂණ ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා 50 ක් මෙම සමුලුවට ලැබී තිබුණි. සමාලෝචනය කිරීමෙන් අනතුරුව තාක්ෂණික සැසි 7 ක් යටතේ පර්යේෂණ පත්‍රිකා 40 ක් මෙම සමුලුවේදී ඉදිරිපත් කරන ලදි. කෙටි සන්නිවේදන වැඩසටහන් 12 ක් ද සමුලුවේදී ඉදිරිපත් කරන ලදි. ඒ අතරින් වඩාත් විශිෂ්ට ඉදිරිපත් කිරීම් සඳහා සම්මාන 09 ක් පිරිනමන ලදි.

| තේමාගත ක්ෂේත්‍රය | පර්යේෂණ පත්‍රිකා නාමය | ශිෂ්‍යයාගේ නම |
|---|---|---|
| ආහාර සහ පෝෂණය | Millet Phenolics as Natural Antioxidants in Food Model Systems and Human LDL / VLDL Cholesterol *in vitro* | දිස්නා කුමාරි |
| අනුජාන විද්‍යාව සහ ශාඛ රෝපණය | Haplotype Diversity Analysis of Bacterial Leaf Blight Resistance Gene *Xa21* in Rice | දනේෂා නානායක්කාර |
| භූමි සම්පත් කළමනාකරණය | Fertilizer Usage and Land Productivity in Intensively Cultivated Vegetable Farming Systems in Sri Lanka: An Analysis Based on a Questionnaire Survey | එච් ඒ එන් උපේක්ෂානි |
| ජනකප්ලාස්මය වර්ගීකරණය සහ ශාඛ ආරක්ෂණය | Genetic Diversity Analysis of "*Murungakayan*" Rice Accessions based on Seed Morphology and Molecular Characterization | එම් එම් එස් එල් මනතුංග |

| තේමාගත ක්ෂේත්‍රය | පර්යේෂණ පත්‍රිකා නාමය | ශිෂ්‍යයාගේ නම |
|---|---|---|
| කෘෂිකාර්මික ඉංජිනේරු හා ද්‍රව්‍ය විද්‍යා | Extraction and Characterization of Bio-based Polymeric Materials from Traditional Rice Straw Varieties in Sri Lanka | ඩබ් ජී ඒ පබසරා |
| සත්ව විද්‍යාව සහ ධීවර | Preliminary Evaluation of Probiotic Potential of Yeasts Isolated from Bovine Milk and Curd of Sri Lanka | ඩී යූ රාජවර්ධන |
| කෘෂිකර්මික ආර්ථික විද්‍යාව සහ ව්‍යාප්තිය | Influence of Users' Technology Readiness on the Perceived Value of Mobile Phone Enabled Internet Services Influence of Users' Technology Readiness on the Perceived Value of Mobile Phone Enabled Internet Services | ඒ එම් ඒ එස් එම් බණ්ඩාර |
| පෝස්ටර් ඉදිරිපත් කිරීම් | Harvest Maturity Affects Postharvest Quality of lime fruits (*Citrus aurantifolia*Swingle) | එස් ඩී සමරදිවාකර |
| සමස්ත හොඳම පත්‍රිකාව | | දනේෂා නානායක්කාර |

## ආ. ජයග්‍රහණ

### පර්යේෂණ ප්‍රකාශන ආධාර අරමුදල

2018 වර්ෂයේ දී විදේශ රටවල පැවැත්වෙන ජාත්‍යන්තර සමුලුවලදී තම පර්යේෂණවල වාචික ඉදිරිපත් කිරීම් සිදු කිරීම සඳහා ශිෂ්‍යයින් 5 දෙනෙකු තෝරා ගන්නා ලදි. මෙම ශිෂ්‍යයින් සඳහා ගමන් වියදම් ලියාපදිංචි කටයුතු යනාදිය වෙනුවෙන් සෑම ශිෂ්‍යයෙකු වෙනුවෙන් රුපියල් 50,000 ක් බැගින් අරමුදල් මෙම ආයතනයේ අනුග්‍රහය යටතේ පිරිණමන ලදි.

### ආචාර්ය ජොඇකිම් අනුස්මරණ සම්මානය

2018 වසරේ දී ඉහලම GPA අගය ලබා ගත් ලබා ගත් ශිෂ්‍යයාට වාර්ෂික සමුළුවේ දී ජොකිම් අනුස්මරණ සම්මානය (මුදල් පරිත්‍යාගයක්) පිරිණමන ලදී. 2018 වසරේ දී පහත සඳහන් ශිෂ්‍යයින් තම උපාධි පාඨමාලා සඳහා ඉහලම GPA අගය වූ ලකුණු 4.00 ලබාගෙන තිබුණි.

ඩී අයි එන් වනිගසූරිය මෙය/ශාබ ආරක්ෂණය
එෆ් එච් සී ඒ සිල්වා මහතා/කෘෂි ඉංජිනේරු විද්‍යාව

## ඇ. අසමාර්තතා

2018 වර්ෂයේදී සැලකියයුතු තරමේ අසමාර්තතා සිදුවී නොමැත

## ඈ අනාගත සැළසුම්

- දේශීය සහ විදේශීය ශිෂ්‍යයින් වැඩි වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම පිණිස නවීන තාක්ෂණ සංවර්ධනයට සමගාමීව වත්මන් අවශ්‍යතා සපුරාලීමට සරිලන පරිදි කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

- සියලුම පශ්චාත් උපාධි පාඨමාලාවල ඉහළ ප්‍රමිතිය ආරක්ෂා කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම ඉහළ නැංවීම අරමුණු කරගෙන වඩා ශිෂ්‍ය හිතකාමී හා නම්‍යශීලි අධ්‍යයන පරිසරයක් බිහි කිරීම.

- පර්යේෂණ උපාධි ශිෂ්‍යයින් ප්‍රමානය ඉහළ නැංවීම.

- සමාජ මාධ්‍ය ජාලා ඵලදායී ලෙස උපයෝගීකර ගනිමින් ශිෂ්‍යයින් බඳවාගැනීම ඉහළ නැංවීම.

- පර්යේෂණ ශිෂ්‍යයින් ප්‍රමානය ඉහළ නැංවීම- ශිෂ්‍යයින්ට තම පර්යේෂණ කටයුතු සිදුකිරීමට පහසුකම් සැලසීම සඳහා සහ මෙම පහසුකම් පිළිබඳ ශිෂ්‍යයින් තුළ පුළුල් ප්‍රචාරයක් සිදුකිරීම සඳහා පර්යේෂණ සහනාධාර අරමුදල සඳහා වැඩි ප්‍රතිපාදන සැලසීමට ආයතනය අපේක්ෂා කරයි.

- ශිෂ්‍යයින් විසින් සිදුකරනු ලබන පර්යේෂණවල ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කරනු පිණිස වඩා ඵලදායී යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ නිවැරදි දිශානතියට යොමු කිරීම.

- සහයෝගීතා ගිවිසුම් හරහා විදේශීය ශිෂ්‍යයින් වැඩි ප්‍රමාණයක් කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ පැවැත්වෙන විවිධ පාඨමාලා සඳහා බඳවා ගැනීම. ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ද ඉදිරි වර්ෂවලදී ශිෂ්‍යයන් කිහිපදෙනෙකු මෙම ආයතනයට එවීමට එකඟවී ඇත.

- කොළඹ ශාඛාවේ බොහෝ පාඨමාලා සහ වැඩමුළු පැවැත්වීම.

- පර්යේෂණ මත පදනම් වූ දැනුම සහ තොරතුරු සමාජයේ පුලුල් කොටසක් ආවරණය වන පරිදි බෙදාහැරීම සඳහා වැඩි වැඩියෙන් කෙටි කාලීන පාඨමාලා පැවැත්විම.

- අධ්‍යයන සැසි පැවැත්වීමට සහ සහයෝගීතා පර්යේෂණ සඳහා විදේශීය මහාචාර්යවරුන්ට ආරාධනා කිරීම සහ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා විදේශ අරමුදල් වැඩි වැඩියෙන් ලබා ගැනීම.

- බහුවිධ මාර්ගගත ගුරු ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දීම.

- පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණ කාර්යයන් සඳහා අන්‍යෝන්‍ය වශයෙන් උපකාරීවන සහයෝගීතා ගොඩනගාගැනීම සඳහා විදේශ විශ්ව විද්‍යාල සහ ආයතන සමග අවබෝධතා ගිවිසුම්වලට එළඹීම.

- කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ සේවකයන්ගේ ඉහළ කාර්යක්ෂමතාවක් ඇති කිරීම උදෙසා සාධනීය මානව සම්පත් ක්‍රියාකාරකම්/වෘත්තීය මාර්ගෝපදේශන/ පුහුණු කටයුතු හඳුන්වාදීම මගින් නව කාර්යසාධන සංස්කෘතියක් ඇති කිරීම.

- දේශීය සහ විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම උදෙසා වඩාත් හිතකර අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීම පිණිස ආයතනයේ යටිතල පහසුකම් ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩි දියුණු කිරීම.

- පුළුල් පරාසයකවූ අවශ්‍යතා සපුරාලනුවස් බාහිර ප්‍රවීණයින්ගේ මගපෙන්වීම් යටතේ ආයතනයේ කළමනාකාරීත්වය ඉහළ නැංවීම සහ ශිෂ්‍යයින්ට/ භාවිතාකරන්නන්ට පහසු ඵලදායී කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම.

- තිරසර සංවර්ධන ප්‍රතිපත්තිවලට සමගාමීව පරිසරය ආරක්ෂාකරගනිමින් සහ පරිසර හානිය අවම කර ගනිමින් සියලු ක්‍රමෝපා ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධයෙන් සියලු පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

## ආ. නව ශිෂ්‍ය ප්‍රවේශය හා ශිෂ්‍ය බඳවා ගැනීම්


### ආ.1 සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු – (2018 දෙසැ. 31 දිනට)

| අධ්‍යයන වැඩසටහන | මුළු ශිෂ්‍යය සංඛ්‍යාව | කාර්ය මණ්ඩල ව්‍යාප්තිය (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි) | | | |
|---|---|---|---|---|---|
| | | අධ්‍යයන | අනධ්‍යයන | අධ්‍යයන සහාය | එකතුව |
| අනියම් | 0 | 1 | 38 | 1 | 40 |
| දර්ශනපති (CR) | 69 | | | | |
| දර්ශනපති (R) | 62 | | | | |
| විද්‍යාපති (CW) | 956 | | | | |
| විද්‍යාපති (CW&R) | 152 | | | | |
| එම්.බී.ඒ (CW) | 189 | | | | |
| එම්.බී.ඒ (CW&R) | 52 | | | | |
| දර්ශනශූරී (CR) | 23 | | | | |
| දර්ශනශූරී (R) | 106 | | | | |
| **එකතුව** | **1609** | 1 | 38 | 1 | 40 |

ආ.2 2018 වර්ෂයේ පශ්චාත් උපාධි වැඩසටහන්වලට ඇතුළත් කරගන්නා ලද දේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු

| අධ්‍යයන වැඩසටහන | පූර්ණ කාලීන/ අර්ධ කාලීන | නව ප්‍රවේශය (2018 ජන-දෙසැ.) | | | ශිෂ්‍ය බඳවා ගැනීම් (2018 දෙසැ. 31 දිනට මුළු ශිෂ්‍ය ලියාපදිංචිය) | | | උපාධි ලැබූ සංඛ්‍යාව* |
|---|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව | |
| අනියම් | අර්ධ කාලීන | 0 | 0 | 0 | 0 | 0 | 0 | |
| දර්ශනපති (CR) | පූර්ණ කාලීන | 0 | 0 | 0 | 26 | 43 | 69 | 10 |
| දර්ශනපති (R) | පූර්ණ කාලීන | 2 | 7 | 9 | 20 | 42 | 62 | - |
| විද්‍යාපති (CW) | පූර්ණ කාලීන | 82 | 184 | 266 | 392 | 564 | 956 | 251 |
| විද්‍යාපති(CW &R) | පූර්ණ කාලීන | 20 | 70 | 90 | 37 | 115 | 152 | - |
| එම්.බී.ඒ (CW) | පූර්ණ කාලීන | 9 | 11 | 20 | 119 | 70 | 189 | 33 |
| එම්.බී.ඒ (CW&R) | පූර්ණ කාලීන | 15 | 6 | 21 | 34 | 18 | 52 | - |
| දර්ශනශූරී (CR) | පූර්ණ කාලීන | 0 | 0 | 0 | 14 | 9 | 23 | 2 |
| දර්ශනශූරී (R) | පූර්ණ කාලීන | 6 | 9 | 15 | 53 | 53 | 106 | 8 |
| ප. උ. ඩිප්ලෝමා | පූර්ණ කාලීන | - | - | - | - | - | - | 18 |
| **එකතුව** | | **134** | **287** | **421** | **695** | **914** | **1609** | |

**ශිෂ්‍ය ලියාපදිංචිය 2016 -2018**



### ආ.3 පශ්චාත් උපාධි වැඩසටහන්වල නියැලි විදේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු - 2018

| අධ්‍යයන වැඩසටහන | පූර්ණ කාලීන/ අර්ධ කාලීන | නව ප්‍රවේශය (2018 ජන. - දෙසැ.) | | | ශිෂ්‍ය බඳවා ගැනීම් (2016 දෙසැ. 31 දිනට මුළු ශිෂ්‍ය ලියාපදිංචිය) | | | උපාධි ලැබූ සංඛ්‍යාව* |
|---|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව | |
| දර්ශනශූරී | පූර්ණ කාලීන | 0 | 2 | 2 | 0 | 4 | 4 | - |
| විද්‍යාපති | පූර්ණ කාලීන | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 |

## ඇ. කාර්යමණ්ඩල තොරතුරු

### ඇ.1 2018 දෙසැ 31 දිනට කාර්ය මණ්ඩලය (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි)

| දෙපාර්තමේන්තුව/ ඒකකය/අංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | | මහාචාර්ය | | සහාය මහාචාර්ය | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | | කථිකාචාර්ය | | ආධුනික කථිකාචාර්ය | | අධ්‍යයන සහාය කාර්ය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| පරිපාලන | | | 1 | | | | | | | | | | | | | | 1 | |

පි - පිරිමි ගැ - ගැහැණු

### ඇ.2 අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු (2018 දෙසැ. 31 දිනට) (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි)

| පීඨය/ දෙපාර්තමේන්තුව/ ශාඛාව | කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වඩා ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය **1** | | ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය **2** | | කණිෂ්ඨ කාර්යමණ්ඩලය **3** | | සුලු සේවක **4** | | එකතුව | |
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| පරිපාලන | - | 2 | - | 2 | 2 | 2 | 8 | 1 | **10** | **7** |
| ලියාපදිංචි | 1 | - | 1 | 2 | 1 | - | 2 | - | **5** | **2** |
| ගිණුම් | - | 1 | - | - | 6 | - | 1 | - | **7** | **1** |
| පරිගණක ඒකකය | 1 | - | - | - | 1 | - | 1 | - | **3** | **-** |
| පුස්තකාලය | - | 1 | - | 2 | - | 1 | 3 | - | **3** | **4** |

*1-* පරිපාලන මට්ටම සහ විධායක මට්ටම
*2-* ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිය
3- ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි
4- ඉහත මට්ටම්වලට පහළ ශ්‍රේණි

### විනෝදාස්වාද කටයුතු- සුබසාධක සංගමය

සුබසාධන සංගමය විසින් පහත සඳහන් වැඩසටහන් සංවිධානය කරන ලදී.

- සාමාජිකයින්ගේ පවුල්වල සහභාගීත්වය ඇතිව 2018 මැයි 01 වැනි දින සිංහල අවුරුදු උත්සවය පැවැත්වීම
- සාමාජිකයින්ගේ පවුල්වල සහභාගීත්වය ඇතිව 2018 සැප්තැම්බර් 23 සහ 24 යන
- දිනවල මහියංගනය දිඹුලාගල පාසිකුඩා සහ සේරුවාවිල යන ප්‍රදේශවල වාර්ෂික විනෝද චාරිකාවේ නිරතවීම

## ඈ. පර්යේෂණ පිළිබඳ දත්ත

### ඈ. 1(අ) 2018 වර්ෂයේ පර්යේෂණ ප්‍රකාශන එළිදැක්වීම

**2018 වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් එළිදක්වනලද පර්යේෂණ ප්‍රකාශන ගණන -** කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) අධ්‍යක්ෂ හැර මෙම ආයතනයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති හෙයින් ආයතනයේ සියලුම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ඉටු කරනු ලබයි. ඔවුන්ගේ ප්‍රකාශන සාමාන්‍යයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලය යටතේ ලැයිස්තුගත කර ඇත. එම නිසා, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශන පහත දත්වා ඇත. (ඇමුණුම I)

<table>
<tr><th rowspan="2">පීඨය</th><th rowspan="2" colspan="2">ප්‍රකාශන බාණ්ඩය</th><th colspan="2">ප්‍රමාණය</th><th rowspan="2">විශේෂ සටහන්</th></tr>
<tr><th>පලකිරීම් දේශීය</th><th>පලකිරීම් විදේශීය</th></tr>
<tr><td></td><td colspan="2">අනුක්‍රමණිකගත වාර සඟරාවල ප්‍රකාශයට පත්කරන ලද සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා</td><td>1</td><td>-</td><td>-</td></tr>
<tr><td></td><td colspan="2">අනුක්‍රමණිකගත නොවන වාර සඟරාවල ප්‍රකාශයට පත්කරන ලද සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td></td><td colspan="2">No. of Full Papers published in non-refereed Journals</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td></td><td colspan="2">සමුලුවලදී සම්පූර්ණ පත්‍රිකා වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද සමුලු පත්‍රිකා ගණන</td><td>2</td><td>-</td><td>-</td></tr>
<tr><td></td><td colspan="2">සංක්ෂිප්ත ප්‍රකාශන ගණන</td><td>5</td><td>-</td><td>-</td></tr>
<tr><td></td><td colspan="2">පලකරනලද ග්‍රන්ථ පරිච්ඡේද ගණන</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td rowspan="2"></td><td rowspan="2">පලකරනලද ග්‍රන්ථ ප්‍රමාණය</td><td>ප්‍රකාශක විසින්</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td>කර්තෘ විසින්</td><td>-</td><td>-</td><td>-</td></tr>
</table>

## ඇ. 1 (ආ) 2018 වසරේදී අනුක්‍රමණිකගත වාර සඟරාවල ප්‍රකාශයට පත්කරන ලද සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා

සමාලෝචනයට භාජනය කරන ලද වසර තුලදී කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍යයින් විසින් පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා 1989 වසරේ සිට අඛණ්ඩව ප්‍රකාශයට පත් කරනු ලබන කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතන වාර සඟරාව වන "Tropical Agricultural Research" පලකර ඇත.

| **පත්‍රිකා නාමය** | **ප්‍රධාන කතෘගේ නම** | **සහය කතුවරුන්ගේ නම්** |
|---|---|---|
| Factors Associated with Illegal Fishing Practices in Three Perennial Reservoirs in Sri Lanka | ර්.එස් වික්‍රමසිංහ | සී.එම්.බී දෙමටවැව<br>යූ. එදිරිසිංහ |
| Screening Milk for Bovine Tuberculosis in Dairy Farms in Central Province, Sri Lanka | එම්.ටී.එල්.කේ ජයසුමන | ටී.අයි ගලප්පත්ති<br>පී.ජී.ඒ පුෂ්පකුමාර<br>සී.ඩී ගමගේ<br>එන්.එච් ස්මිත් සහ<br>එච්.ආර්.එන් ජිනදාස |
| Changes in Structural and Chemical Properties of Rice Husk Biochar Co-pyrolysed with *Eppawala* Rock Phosphate under Different Temperature | ඩී.කේ.ආර්.පී.එල් දිසානායක | ආර්.එස් ධර්මකීර්ති<br>ඒ.කේ කරුණාරත්න සහ<br>ඩබ්.එස් දන්දෙනිය |
| Molecular Identification of *Fusarium*spp. from Wilt-infected Tomato and Brinjal Plants in Selected Regions of Sri Lanka and Endophytic Bacteria as a Potential Option for Disease Management | ඩබ්.ඒ.පී.ජී වීරරත්න | ඩී.එම් ද කොස්තා |
| Fertilizer Usage and Land Productivity in Intensively Cultivated Vegetable Farming Systems in Sri Lanka: An Analysis Based on a Questionnaire Survey | එච්.ඒ.එන්.යූ උපේක්ෂානි | ආර්.එස් ධර්මකීර්ති<br>පී. වීරසිංහ<br>ඩබ්.එස් දන්දෙනිය |
| Haplotype Diversity Analysis of Bacterial Leaf Blight Resistance Gene Xa21 in Rice | එන්.එච්. එල්.ඩී. නානායක්කාර | වී.හේරත්<br>ඩී. වී ජයතිලක |
| Labor Migration and Impact of Remittances on Poverty and Income Inequality: Evidence from Estate Sector of Sri Lanka | ආර්.ඒ.පී.අයි.එස් ධර්මදාස | ජේ. වීරහේවා සහ<br>පී. ඒ. සමරතුංග |

| පත්‍රිකා නාමය | ප්‍රධාන කතෘගේ නම | සහය කතුවරුන්ගේ නම් |
|---|---|---|
| Performance Evaluation of a Down Draft Double Chamber Pyrolysis Reactor under Field Conditions | ඒ.එම්.වයි.ඩබ් අලහකෝන් | ඒ.කේ කරුණාරත්න සහ<br>ආර්.එස් ධර්මකීර්ති |
| Macronutrient Composition of Selected Traditional Yams Grown in Sri Lanka | ඩබ්.එම්.ඒ.ඒ. කුලසිංහ | එස්. විමලසිරි,<br>පී. සමරසිංහ<br>ආර්. සිල්වා සහ<br>ටී. මදුජිත් |
| Development of an Effective Propagation Protocol for Osbeckiaoctandra (L.) DC. (HeenBovitiya) | ඩී.එම්.අයි.සී.බී දසනායක | එස්. ඒ. ක්‍රිෂ්ණරාජා සහ<br>ජේ.පී.ඊෂ්වරා |
| Mapping of Soil Erosion Hazard Zones of Sri Lanka | එම්.ජේ.පී.ටී.එම් ජයසේකර | එච්.කේ කඩුපිටිය සහ<br>යූ.ඩබ්.ඒ.විතාරණ |
| Use of Free Open Source Software Technologies to Enhance Knowledge Mobilization in Smallholder Agricultural Communities in Sri Lanka | එච්.ඒ.සී.කේ ජයත්ලක | යූ.කේ. ජයසිංහ- මුදලිගේ<br>එල්.ඩී.ආර්.ඩී පෙරේරා<br>පී. ඒ.ගවු<br>එන්. වෛද්‍යනාථ |
| Serum Metabolic Profile Based Assessment of Nutritional Status of Temperate Crossbred, Stall-fed, Lactating Dairy Cows: A Case Study of a Medium Scale Mid-country Cattle Farm | එච්.එම්.පී.පී. හේරත් | කේ.කේ.ටී. එන් රණවීර<br>ඩබ්.එම්.පී.බී වීරසිංහ<br>එම්. බී.පී.කේ මහීපාල |
| Morphological Characterization of Local and Introduced Finger millet (Elusinecoracana (L.) Gaertn) Germplasm in Sri Lanka | ඩබ්.එම්.ආර් කුමාරි | ඩී.කේ.එන්.පී පුෂ්පකුමාර<br>ඩබ්.එම්. ඩබ් වීරකෝන්<br>ඩී.එම්.ජේ.බී සේනානායක<br>එච්.ඩී. උදයකුමාර |
